# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**


ගරු ජනාධිපති, 2022-10-24
රනිල් වික්‍රමසිංහ මැතිතුමා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

**"අපේක්ෂක වියදම් සීමාකිරීමේ" කෙටුම්පත සම්මත කිරීම සම්බන්ධවයි.**

22 වන ව්‍යවස්ථා සංශෝධනය තුළින් ශ්‍රී ලංකාව වඩා ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුවක් ඇතිකරගැනීමට තිබූ ස්වර්ණමය අවස්ථාවක් මගහැරී ගියද 20 වන ව්‍යවස්ථා සංශෝධනයට සාපේක්ෂව සාධනීය සංශෝධනයක් ගෙන ඒම පිළිබඳව ඊට මුල්වූ ඔබතුමා ඇතුලු ඡන්දය භාවිත කල සියලු දෙනාට පැෆ්රල් සංවිධානයේ ප්‍රසාදය පලකරමු.

එමෙන්ම ඊට සමාන්තවර මැතිවරණ ක්‍රමය සංශෝධනය සඳහාවූ ඔබගේ යෝජනා තුළ වඩා ප්‍රමුඛ යෝජනාවක් ලෙස අපේක්ෂක වියදම් සීමාකිරීමේ නීතී ගෙන ඒමේ අවශ්‍යතාවය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමුවීම"අපේක්ෂක වියදම් සීමාකිරීමේ" සමාජ කතිතාවතට මුල්වූ සහ ඒ පිළිබඳව කෙටුම්පත් ඉදිරිපත් කල පාර්ශවයක් වශයෙන් අපගේ ස්තූතිය පුද කිරීමට මේ මොහොත අවස්ථාවක් කරගනිමු. තවද එකී සංශෝධනය මැතිවරණ ක්‍රමයේ පුලුල් සංශෝධනයකින් තොරව වුවද සිදුකල හැකි බව ඔබතුමාගේ අවධානයට යොමුකිරීමට කැමැත්තෙමු.

2015 වර්ෂයේ සිට "අපේක්ෂක වියදම් සීමාකිරීම" පිළිබඳව සාකච්ඡා සිදුවූ අතර, මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා දේශපාලන පක්ෂ අතර ඇතිවූ සාකච්ඡා අනුව ඊට අදාලව කෙටුම්පත් කිහිපයක්ම සැකසිනි. එහි අවසන් කෙටුම්පත සඳහා අවස්ථා දෙකකදී කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. (ඔබතුමන් අග්‍රාමාත්‍ය ධුරය දැරූ යහපාලන රජයේ කැබිනට් මණ්ඩලයට හා ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති ධුරය දැරූ කැබිනට් මණ්ඩලයට) ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක ඊට අදාල කෙටුම්පත් සකස් කර ඇති අතර එයටද පසුගිය කැබිනට් මණ්ඩලයේ අනුමැතියද ලැබී ඇති බව වාර්තාවේ.

එබැවින් ඔබතුමා සිදුකිරීමට අපේක්ෂිත පුලුල් සංශෝධනවල ආරම්භක පියවර ලෙස ඉදිරි සති කිහිපය තුළ එකී කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගැනීමට කටයුතු කරන ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිමු.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ
පිටපත්

විජයදාස රාජපක්ෂ මහතා, අධිකරණ හා බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.
නිමල් ජී. පුංචිහේවා මහතා, සභාපති, මැතිවරණ කොමිෂන් සභාව.
උනන්දුවක් දක්වන සෙසු පාර්ශව


#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com